## විශේෂ නිවේදනයි

## කොන්සියුලර් සේවා සැපයීම-ශ්‍රී ලංකා තානාපති කාර්යාලය-රෝමය, ඉතාලිය

රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් කොන්සියුලර් සේවා ලබාගැනීමට අපේක්ෂිත , ඉතාලියේ වෙසෙන ශ්‍රී ලාංකිකයන් හට ඒ සඳහා නිශ්චිත කාලවේලාවක් වෙන් කරගැනීම සඳහා විශේෂිත ක්‍රමවේදයක්අනුගමනය කරනු ලබන අතර, එමඟින් මහජනතාව වෙත අවම කාලයක් තුළ ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් ලබා දීමටඅපේක්ෂා කෙරේ.

මෙම විශේෂ ක්‍රියාපටිපාටිය යටතේ, අයදුම්කරුවන් විසින් තානාපති කාර්යාලයීය නිල වෙබ් අඩවියේ ඇති සබැඳිය ඔස්සේ කොන්සියුලර් සේවා සඳහා නිශ්චිත වේලාවක් වෙන්කර ගතයුතු වේ . නිසි පරිදි වේලාවක් වෙන් කරගැනීමෙන් පසුව අයදුම්කරු හට ඒ බව සනාථ කරමින් , අදාළ සේවාව, දිනය හා වේලාව සහිත ලේඛනයක් විද්‍යුත් තැපෑලෙන් එවනු ලැබේ . ඒ අනුව අදාළ සේවාව සඳහා වන අයදුම්පත හා ඊට අදාළ අවශ්‍ය සියළු ලේඛනවල මුල්පිටපත් ද, වේලාව වෙන්කර ගැනීම සනාථ කිරීම සඳහා වන ලේඛනය ද සමග නියමිත දින නියමිත වේලාවට තානාපති කාර්යාලයට පැමිණිය යුතු වේ.

රෝමයේ තානාපති කාර්යාලයෙන් කොන්සියුලර් සේවා ලබා ගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් අදාළ අයදුම්පත් සහ අවශ්‍ය උපදෙස් සඳහා තානාපති කාර්යාලයීය නිල වෙබ් අඩවිය වෙත යොමු වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. සියළුම අයදුම්කරුවන්, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහ ඊට අදාළ ලේඛනවල මුල්පිටපත් තානාපති කාර්යාලයේ කොන්සියුලර් කවුන්ටර වෙත පෞද්ගලිකව ඉදිරිපත් කළ යුතුය.

**තානාපති කාර්යාලයීය නිල වෙබ් අඩවිය** https://www.srilankaembassyrome.org

අයදුම්කරුවන් හට මේ සම්බන්ධ වැඩිමනත් විස්තර අවශ්‍ය නම් , සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. 09.30 සිටප.ව. 05.00 දක්වා දුරකථන අංක (0039) 06 8840801 අංකය ඔස්සේ කොන්සියුලර් අංශය සම්බන්ධ කර ගත හැකිය.

පවත්නා COVID 19 වසංගත තත්වය යටතේ, සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේදයන් දැඩි ලෙස අනුගමනය කලයුතු හෙයින්,තානාපති කාර්යාලයේ කොන්සියුලර් සේවා ලබාගැනීම සඳහා ඉහත පරිදි වෙබ් අඩවිය ඔස්සේ වේලාවක් වෙන් කරගැනීම අනිවාර්යවන අතර, නිශ්චිත වේලාවක් වෙන්කර නොගෙන පැමිණෙනඅයදුම්කරුවන්හටසේවාවන්සපයනු නොලැබේ.

**අනුගමනය කළ යුතු සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේද**

තානාපති කාර්යාලයට පැමිණෙන සියලුම මහජනතාව අතර වෛරසය පැතිරීම පාලනය කිරීම සඳහා ඉතාලි සෞඛ්‍ය බලධාරීන් විසින් නියම කර ඇති පරිදි පහත සඳහන් සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය.

- අත්වැසුම් සහ මුහුණු ආවරණ පළඳින්න.
- එකිනෙකා අතර මීටරයක පරතරයක් පවත්වා ගන්න.
- ඇතුලුවීමේ දොරටුවේදී ඔබගේ දෑත් හොඳින් සෝදන්න
- සියලුම අමුත්තන්ගේ ශරීර උෂ්ණත්වය ඇතුලුවීමේ දොරටුවේදී පරීක්ෂා කරනු ලැබේ.

එක් එක් අයදුම්කරුගේ නමින් වෙන් වෙන්ව වේලාවන් වෙන් කර ගත යුතු අතර , අදාළ වේලාව නියමිත පරිදි වෙන්කරගෙන ඇතිද යන්න තහවුරු කරගැනීම සඳහා කවුන්ටරයේ නැවත පරීක්ෂාවට ලක් කෙරේ. කරුණාකර, එක්සේවාවක් වෙනුවෙන් එක් අයදුම්කරුවෙකුකිහිප වරක් වේලාවන් වෙන් කරගැනීමෙන් වලකින්න.

වේලාවක් වෙන්කර ගැනීම සඳහා,

**සබැඳිය :** https://smartscheduling.com/slembrome

**28.06.2020**

**ශ්‍රී ලංකා තානාපති කාර්යාලය - රෝමය, ඉතාලිය**